# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,673 — 1966 පෙබරවාරි 17 වැනි බ්‍රහස්පතින්ද — 1966.2.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | 149 | ආදයම හා වියදම පිළිබඳ ප්‍රකාශන | — |
| කතුරු-ඇබෑර්තු | 150 | අය-වැය ලේඛන | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 154 | ඉදපළ විකිණීම | — |
| අතුරු ව්‍යවස්ථා | 155 | මාර්ග කොමිටි දන්වීම | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම | — | විවිධ දන්වීම | 157 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී—බී. 69/41
ජී. ජේ. 1/2/2

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 (2) වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 2 වැනි දින
කොළඹ දීය.

### ආඥාව

කෑගල්ල දිස්ත්‍රික්කයේ කදුඅහ පත්තුව ගම්සභාවේ පාලන සීමා ඇතුළතවූ ප්‍රදේශය, ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියෙහි තුන්වැනි අතුරු විධානයේ සඳහන් අක්කර බද්ද පනවා අය කිරීම සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2–770/1–66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමුකෙරේ.

**නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා "ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ" දන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින අඟලකට රු. 10ක් සහ වැඩිවන සෑම අඟලක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10 බැගින් අය කරනු ලබන ගාස්තුව වෙනුවට, 1966 මාර්තු මස 1 වෙනි දින සිට, වෙළඳ ලකුණු දන්වීම් හැර, අන් සියළුම දන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 15 බැගින්ම අය කරනු ලබන බව සැමදෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.**

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1966 පෙබරවාරි මස 11 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

ඇල්. ඕ.—බී. 69/41
ජී. ජේ. 1/2/2

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පලාත් පාලන ඇමති මුරුගේෂන් තිරුචෙල්වම් වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ කඳුඅහ පත්තුව ගම් ප්‍රදේශයේ ගම්සභාවට, ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පලාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ දීය.

2–770/2—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ—බී. 69/41.
ජී.ජේ. 1/2/1.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පලාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවත පත්තු ගම් ප්‍රදේශයේ ගම් සභාවට, ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පලාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ දීය.

2–769/1—66.2.17දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ—බී. බී. 69/41.
ජී. ජේ. 1/2/1.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 (2) වැනි වගන්තිය යටතේ පලාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පලාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ දීය.

#### ආඥාව

කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවත පත්තු ගම්සභාවේ පරිපාලන සීමා ඇතුළතවූ ප්‍රදේශය, ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ තුන්වැනි අතුරු විධානයේ සඳහන් අක්කර බද්ද පනවා අයකිරීම සඳහා විශෙෂ ප්‍රදේශයක් වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2–769/2—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

### මඩකලපුව සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කිරීම පිණිස ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම

මඩකලපුව සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කිරීමට ගරු පලාත් පාලන ඇමතිතුමා තීරණය කොට ඇති අතර, එම තීරණයට අනතුරුව, මෙහි පහත දැක්වෙන කාර්‍ය භාරයන් පිළිබඳව පරීක්ෂා කොට වාර්තා කිරීම පිණිස, විශ්‍රාම ලත් දිස්ත්‍රික් විනිශ්චයකාර තැන් පත් එස්. තම්බිදුරෙයි මහතා කොමසාරිස් තැන වශයෙන් පත් කොට සිටී:—

(අ) දැනට පවතින මඩකලපුව පලාත් ආණ්ඩු සභාවේ පරිපාලනයට බාහිරව පිහිටි ප්‍රදේශ, අවශ්‍ය නම්, යෝජිත මහා නගර සභාවට එකතු කිරීම;

(ආ) යෝජිත මඩකලපුව මහා නගර සභාව නියෝජනය කළ යුතු සාමාජිකයන් සංඛ්‍යාව, ඒ සඳහා වූ ජනගහනයේ ප්‍රමාණය සහ වෙනත් අදාල කරුණු;

(ඇ) යෝජිත මඩකලපුව මහා නගර සභාවේ සීමාවන් සම්බන්ධව අර්ථ නිරූපනය කිරීම;

(ඈ) යෝජිත මඩකලපුව මහා නගර සභාවේ එක් එක් නියෝජිත කොට්ඨාශවල සීමාවන් සම්බන්ධව අර්ථ නිරූපනය කිරීම.

මෙම කාර්‍යභාරයන්ට අදාල වූ ඕනෑම කරුණක් සම්බන්ධව, ඕනෑම සංවිධානයකට හෝ පොදු ජනතාවට හෝ ඔවුන්ගේ ලිඛිත නියෝජනයන්, 1966 පෙබරවාරි මස 28 වෙනි දිනයට හෝ ඒ දිනයට ප්‍රථම හෝ පහත අත්සන් කළ අය වෙත ඉදිරිපත් කරන ලෙස පරීක්ෂණ කොමිසම ඉල්ලා සිටී.

එසේ ඉදිරිපත් කෙරෙන ලිඛිත නියෝජනයන්, පිටපත් තුනකින් යුක්ත විය යුතු අතර, ඒවා යතුරු ලියනය කොට ඉදිරිපත් කරන්නේ නම් වඩා සුදුසුය.

1966 මාර්තු මස 7, 8, 9 සහ 10 දිනවල සෑම දිනක ම පෙරවරු 10.00 ට මඩකලපුවේ නගර සභාවේ දී, වාචික නියෝජනයන් භාර ගැනීම සඳහා, පරීක්ෂක කොමිසම රැස්වෙනවා ඇත.

උක්ත කාර්‍යභාරයන්ට අදාල වූ වාචික නියෝජනයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අයවලුන්ගෙන්, ස්වකීය නම් සහ ලිපිනයන් ද, 1966 පෙබරවාරි මස 28 වෙනි දිනට හෝ ඒ දිනයට ප්‍රථම හෝ පහත දැක්වෙන ලිපිනයට දැනුම් දෙන ලෙස පරීක්ෂණ කොමිසම කරුණාවෙන් ඉල්ලා සිටී. ඉක්බිති, ඔවුන්ගේ වාචික නියෝජනයන් ඉදිරිපත් කළ යුතු දිනය, ලියවිල්ලක මගින් ඔවුන් වෙත දැනුම් දෙනවා ඇත.

බී. ඒ. ජේ. කාසිනාදර්,
ලේකම්,
පරීක්ෂණ කොමිසම,

නැගෙනහිර පලාතේ,
පහල කොටසේ
පලාත් පාලන සහකාර කොමසාරිස් බාරේ,
මඩකලපුව.
66. 2. 8.

2–789—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පලාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අත්‍යාකාරයකින් සඳහන් කො නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පලාත් පාලන සේවා ආඥාපනතේ 264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බැඳීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් කොණ්ඩ පලාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් උසුලන ලබද්දී, 1952 පලාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පලාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු

**(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වූවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**(vii) අයදුම්පත් වනාහි මීට සාකොට ඇති ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.**

**(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පෑති.**

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

**සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.**

**(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට** අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### ———— තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්. ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—.

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ /හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### පාරේ ගල් තලන යන්ත්‍ර රියැදුරු තනතුරු—කොළඹ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප :—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 918—13×42—රු. 1,464. තෝරාගනු ලබන අපේක්ෂකයා, සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ වැටුප් පෙත්තක තබත හැකිය.

3. අවශ්‍ය සුදුසුකම් :—(අ) වයස : 1966. 3. 8 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(i) ස්ටීම් හා/හෝ ඩීසල් රෝඩ් රෝලර් ධාවනය පිළිබඳ අවුරුදු (3) තුනකට නොඅඩු පළපුරුද්ද සහ,

(ii) අඩු වශයෙන් අයදුම්පත් භාර ගන්නා දිනයට අවුරුදු 1කට ප්‍රථමයෙන්වත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, කර්මාන්ත ශාලා ඉංජිනේරුවරයා විසින් නිකුත් කරන ලද ස්ටීම් හා ඩීසල් රෝඩ් රෝලර් ධාවනය පිළිබඳ ප්‍රවීණත්ව සහතිකය ලබා තිබීම.

(i) සහ (ii) ඡේදයන්හි කරුණු ඔප්පු කිරීම සඳහා සහතික පිටපත්, අයදුම්පතට ඇමිණිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966. 3. 8 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් ඇකෘති පත්‍රයේ 7 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය :—

"7. කාර්මික සුදුසුකම් :—

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ශාලා ඉංජිනේරුවරයා විසින් නිකුත් කරන ලද ස්ටීම් හා/හෝ ඩීසල් රෝඩ් රෝලර් ධාවනය කිරීමට ප්‍රවීණතාවයක් ලබා තිබේද යන වග,

(ආ) ස්ටීම් හා/හෝ ඩීසල් රෝඩ් රෝලර් පැදවීමේ පළපුරුද්ද පිළිබඳ සවිස්තර තොරතුරු ".

6. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක්, ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 පෙබරවාරි මස 10 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

2–765—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### පරීක්ෂක තනතුරු

යථෝක්ත තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අපේක්ෂකයෝ, පළමු අවස්ථාවෙහි දී කොළඹ නාගරික සභාවෙහි ඉංජිනේරු දෙපාර්තමේන්තුවට පත්කරනු ලැබෙත්.

2. වැටුප.—එක් එක් තනතුරකට අදාළ වැටුප් පරිමානය වසරකට රු. 1,860—17×120 සහ 8×180— රු. 5,340 කි. වසරකට රු. 3,420 ට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් ද, වසරකට රු. 4,800 ට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉමක් ද වේ.

3. කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු ඕවර්සියර්වරුන්ගේ සහ අවශේෂ ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි කර්මාන්ත අධිකාරීන්ගේ සහ පරීක්ෂකවරුන්ගේ අයදුම්පත් පමණක් පිළිගනු ලැබේ.

අපේක්ෂකයිනට පහත දක්වන සුදුසුකම් තිබිය යුතුයි :—

(i) අවුරුදු හතක ප්‍රායෝගික පළපුරුද්දක්. මෙයින් යටත් පිරිසෙයින් අවුරුදු දෙකක්වත් සිවිල් ඉංජිනේරු කර්මාන්තය පිළිබඳව විය යුතුයි. එසේ නැතහොත්,

(ii) සිවිල් ඉංජිනේරු කර්මාන්තය පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු පහක ප්‍රායෝගික පළපුරුද්දක්.

පහත දක්වන ශිල්පීය සුදුසුකම් වලින් එකක් ද අයදුම්කරුවනට තිබිය යුතුයි :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය (සිවිල්) ;

(ආ) ලංකා කාර්මික විද්‍යාලයයේ නාගරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව) ;

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයයේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව) ;

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයයේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව) ; එසේ නැතහොත්, ඊට සමාන හෝ උසස් සුදුසුකමක්.

4. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර ඇති පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, 1966 මාර්තු මස 8 වැනි දිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයයට ලැබෙන, ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම බාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක්, ලද බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

2–787—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### මුරකරු තනතුර—දෙහිඕවිට සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය :—වර්ෂයකට රුපියල් 540—30×8—24×1—රු. 804. රු. 636 සහ රු. 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්‍ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස 1966.3.7 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු, 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්‍ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ. දෙවැනි භාෂාව පිළිබඳ ක්‍රියාත්මක දැනීමක් අතිරේක සුදුසුකමක් වනු ඇත. හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සළකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1966. 3. 7 වැනි දිනට හෝ ඊට පළමු දෙහිඕවිට සුළු නගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

කේ. ඩී. බී. කැණිමියස්,
දෙහිඕවිට සුළු නගර සභාවේ සභාපති.

1966 පෙබරවාරි මස 10 වැනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේදී ය.

2–578—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### I, II, III ශ්‍රේණිවල විදුලිය අධිකාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය.—1965.10.23 හා 1965.10.24

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දී ඇති විෂයයන්ගෙන් සමත් වී ඇති බැව් මෙයින් දන්වනු ලැබේ :—

| නම | ප්‍රාදේශීය බලමණ්ඩලය | සමත් කළ විෂයයන් |
|---|---|---|
| **I වන ශ්‍රේණිය** | | |
| 1. රාජා, එස්. වී. ... | ... මඩකලපුව ප. ආ. සභාව | ... I. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| 2. මහාලිංගම්, එම්. ... | ... යාපනය නාගරික සභාව | ... I. විදුලි ඉජිනේරු විද්‍යාව II<br>II. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| * 3. ගුණවර්ධන, ඩී. බී. ඩබ්ලිව්. | ... බදුල්ල නාගරික සභාව | ... I. විදුලි ඉංජිනේරු විද්‍යාව I<br>II. විදුලි ඉංජිනේරු විද්‍යාව II<br>III. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| **II වන ශ්‍රේණිය** | | |
| * 4. ලීනගේ, ඩී. ජේ. පී. ... | ... මහරගම සු. න. සභාව | ... I. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| * 5. සමරසිංහ, ඩී. පී. ඒ. ද එස්. | ... ජාඇල ප. ආ සභාව ... | ... I. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| 6. ග්‍රිග්සන්, එච්. එෆ්. ... | ... වාද්දුව සුළු නගර සභාව | ... I. විදුලි ඉංජිනේරු විද්‍යාව I<br>II. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| * 7. දිසානායක, එම්. ඊ. ... | ... කොහෙල්වත්ත සු. න. සභාව | ... I. විදුලි ඉංජිනේරු විද්‍යාව I<br>II. විදුලි ඉංජිනේරු විද්‍යාව II<br>III. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| 8. දිසානායක, ඩී. ඒ. ඊ. ... | ... කඳාන සුළු නගර සභාව | ... I. විදුලි ඉංජිනේරු විද්‍යාව II |
| * 9. සිවගුරුනාදන්, එම්. ... | ... කට්ටන්කුඩි සුළු නගර සභාව | ... I. විදුලි ඉංජිනේරු විද්‍යාව I<br>II. විදුලි ඉංජිනේරු විද්‍යාව II<br>III. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| **III වන ශ්‍රේණිය** | | |
| *10. කරුණාරත්න, එච්. කේ. ... | ... අවිස්සාවේල්ල ප. ආ. සභාව | ... I. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් |
| *11. ජයකොත්ති, ඩී. කේ. ... | ... බෙරුවල ප. ආ. සභාව | ... I. විදුලි ඉංජිනේරු විද්‍යාව I |

* විභාගය සම්පූර්ණ කර ඇත.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 පෙබරවාරි මස 7 දින,
තැ. පෙ. 530, කොළඹ.

2–775—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වෘත්තීය සුදුසුකම් නොලත් කර්මාන්ත ඉංජිනේරුවරුන්ගේ සේවයට (සිවිල්) උසස් කිරීමේ විභාගය—1964 දෙසැම්බර්

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දී ඇති විෂයයන්ගෙන් සමත් වී ඇති බැව් මෙයින් දන්වනු ලැබේ :—

1. ධර්මදාස පී. එච්. ... (I) වාස්තු විද්‍යාත්මක ඇඳීම.
2. පෙරේරා ඊ. ඊ. සී. ... (II) සිවිල් ඉංජිනේරු විද්‍යාව II
3. පීරිස් එම්. එච්. ... (I) සිවිල් ඉංජිනේරු විද්‍යාව I
(II) ගොඩනැගිලි ප්‍රමාණ ගැනීම හා ගොඩනැගිලි ඇස්තමේන්තු කිරීම.
(III) වාස්තු විද්‍යාත්මක ඇඳීම.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 පෙබරවාරි මස 7 දින,
තැ. පෙ. 530, කොළඹ.

2–776—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඕ.—බී. 23/44

## රත්නපුර නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ රත්නපුර නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1965 දෙසැම්බර් මස 20 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

1964 අප්‍රේල් 22 වන දින අංක 16,016 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත 1944 සැප්තැම්බර් 15 වන දින අංක 9,311 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1944 රත්නපුර වෙළඳ පොළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 6 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු ව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් :—

"6 (1) සභාපතිගේ බලය පිට හෝ යටතේ මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන්නකු හෝ ඔහුගේ වැඩ කරුවකු හෝ නියෝජිතයකු වන්නේ නම් මිස හෝ එබඳු අවසර පත්‍රයක නියමයන් හා කොන්දේසි අනුව විනා කිසිවකු විසින් පොදු වෙළඳ පොළේ යම් වෙළෙඳ පිලක්, කඩබක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කිරීම හෝ පරිහරනය කිරීම නොකළ යුතුය.

(2) (1) වන ඡේදයේ සඳහන් සෑම අවසර පත්‍රයක්ම මීට යාකොට ඇති උපලේඛනයේ 1 වන කොටසේ දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූලව පිළියෙල කළ යුතුය.

(3) සෑම අවසර පත්‍රයක් දරන්නකු විසින්ම මීට යාකොට ඇති
2. ඊට යාකොට ඇති අ උපලේඛනයේ I වන කොටසේ "ඉහත ප්‍රමාණ අනුව කුලී හෝ ගාස්තු ගෙවිය යුතුය.";

2. ඊට යාකොට ඇති අ උපලේඛනයේ I වන කොටසේ "ඉහත දැක්වෙන ගාස්තු භාරගතිමි" සහ "මුදල් භාරකරු" යන වචන අත්හැරීමෙන් ;

3. ඊට යාකොට ඇති අ උපලේඛනයේ 1 වන කොටසට ඉක්බිතිවම පහත සඳහන් කොටස ඇතුළත් කිරීමෙන් :—

"2 කොටස—ගාස්තු

| අවසර පත්‍රය | | මාසික ගාස්තුව හෝ කුලිය රු. | ශ. |
|---|---|---|---|
| අංක 1 දරණ හරක් මස් කඩ පිල | ... | 275 | 0 |
| අංක 2 දරන හරක් මස් කඩ පිල | ... | 275 | 0 |
| අංක 3 දරන හරක් මස් කඩ පිල | ... | 275 | 0 |
| අංක 1 දරන එළුමස් කඩ පිල | ... | 125 | 0 |
| අංක 2 දරන එළුමස් කඩ පිල | ... | 125 | 0 |
| කුකුල් මස් කඩ පිල | ... | 45 | 0 |
| ඌරු මස් කඩ පිල | ... | 7 | 50 |
| අංක 1 දරන මාලු කඩ පිල | ... | 150 | 0 |
| අංක 2 දරන මාලු කඩ පිල | ... | 150 | 0 |
| අංක 3 දරන මාලු කඩ පිල | ... | 150 | 0 |
| අංක 1 දරන එළවලු කඩ පිල | ... | 30 | 0 |
| අංක 2 දරන එළවලු කඩ පිල | ... | 18 | 0 |
| අංක 3 දරන එළවලු කඩ පිල | ... | 18 | 0 |
| අංක 4 දරන එළවලු කඩ පිල | ... | 20 | 0 |
| අංක 5 දරන එළවලු කඩ පිල | ... | 40 | 0 |
| අංක 6 දරන එළවලු කඩ පිල් | ... | 18 | 0 |
| අංක 7 දරන එළවලු කඩ පිල | ... | 18 | 0 |
| අංක 8 දරන එළවලු කඩ පිල | ... | 45 | 0"; |

සහ

4. ඊට යාකොට ඇති ඇ උපලේඛනයේ (ඇ) අංකයෙහි "වර්ග අඩි 48 ට වැඩි වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "වර්ග අඩි 48 ට වැඩි වන, නමුත් වර්ග අඩි 60 ට වැඩි නො වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

7–780—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඕ.—බී. 13/64.

## චුන්නාකම් සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 (3) වැනි වගන්තිය යටතේ චුන්නාකම් සුළු නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජනවාරි මස 29 දින,
කොළඹ දී ය.

### වාහන හා සතුන් පිළිබඳ බද්දට අදාළ අතුරු ව්‍යවස්ථා

1. 1946 ඔක්තෝබර් 4 වැනි දින අංක 9,609 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද වාහන හා සතුන් පිළිබඳ බද්දට අදාළ ව්‍යවස්ථාවල 211 වැනි ව්‍යවස්ථාව යටතේ සැපයිය යුතු උපලේඛනය නොසැපයිය යුතුය.

2. ආඥාපනතේ 161 හා 162 වැනි වගන්ති යටතේ වාහන හා සතුන් සම්බන්ධයෙන් සභාව විසින් පනවනු ලැබූ වාර්ෂික බද්ද සෑම වර්ෂයකම මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර සභා කාර්යාලයේදී ගෙවිය යුතුය.

3. (1) වාර්ෂික බද්ද ගෙවා ඇති හැම වාහනයක් වෙනුවෙන්ම ඒ වාහනයට අදාළ වූද, තහඩුව නිකුත් කරනු ලබන වර්ෂය දක්වන ඉලක්කම් හා වාහන ලේඛනයේ සඳහන් අනුරූප අංකය අඩංගු වූද, මීට යාකොට ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් ඒ ඒ වාහනවලට විශේෂ වූ අකුරු සහිත වානේ තහඩුවක් සභාපති විසින් නිකුත් කිරීම හෝ නිකුත් කරවීම කළ යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ නිකුත් කරන ලද යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව හෝ මැකීගොස් තිබේ නම්, එම තහඩුව අයිතිකරු විසින් එය සභාපති වෙත ආපසු බාරදී ශත විසිපහක මුදලක් ගෙවූ විට ඔහුට අළුතින් තහඩුවක් ලබා ගැනීමට අයිතිවාසිකම තිබිය යුතුය.

(3) (1) වැනි ඡේදය යටතේ නිකුත් කරන ලද යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බවට දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් සභාපතිට ඒත්තු ගැන්වීමෙන් පසු ඔහු විසින්, අයිතිකරුගේ ඉල්ලීම පිට හා ඒ අයිතිකරු විසින් ශත පණහක් ගෙවනු ලැබූ විට, ඔහුට අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

4. (1) 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ තහඩුවක් නිකුත් කරනු ලැබූ යම් වාහනයක් තම ස්වාමිත්වයෙහි, භාරකාරත්වයෙහි හෝ පාලනයෙහි තබා සිටින තැනැත්තකු විසින් එය ඒ වාහනයේ කාටත් පෙනෙන ස්ථානයක සවි කළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ විධි විධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම රුපියල් පනහකට වැඩි නොවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වැරදිකරු විය යුතුය.

5. සභාපති විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් 4(1) වැනි අතුරු ව්‍යවස්ථාවෙන් වාහනයට සවිකිරීමට නියමිත තහඩුව පරීක්ෂා කර බැලීම සඳහා යම් වාහනයක් නතර කිරීම නිත්‍යානුකූල විය යුතුය. එසේ නතර කරන ලෙස ඉල්ලා සිටි විට රියදුරු විසින් එය නතර කර එසේ පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුවාක් හැර ඊට සහායද විය යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවල "සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ ; "සභාව" යනුවෙන් චුන්නාකම් සුළු නගර සභාව අදහස් වේ ; "ආඥාපනත" යනුවෙන් (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත අදහස් වේ.

### උපලේඛනය

| | | |
|---|---|---|
| වෙළඳ කටයුතු නොවන වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරන බයිසිකලයකට | ... | சு.ப.ஞ. |
| වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන බයිසිකලයකට ... ... | ... | சு.ப.ஞ.வி. |
| තනිගොනා බඳනා බරකරත්තයකට | ... | சு.ப.ஒ. |
| ගොන් දෙන්නා බඳනා බර කරත්තයකට | | சு.ப.இ. |
| කුලී වැඩ සඳහා යොදවන තනිගොනා බඳින බර කරත්තයකට ... | ... | சு.ப.ஒ.வா. |
| කුලී වැඩ සඳහා යොදවන ගොන්දෙන්නා බඳිනා බර කරත්තයකට ... | ... | சு.ப.இ.வா. |
| ජින් රික්ෂෝ රථයකට ... | ... | சு.ப.றி. |
| අත් කරත්තයකට ... | ... | சு.ப.கை. |

7–781—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

ඇල්.ඩී—බී. 9/65.

## කැළණිය සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 වෙනි සහ 156 වෙනි වගන්ති යටතේ කැළණිය සුළු නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥපනතේ 153 වෙනි වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා කෙරෙහි පැවැරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජනවාරි මස 29 වෙනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1\. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුයි :—

(1) කබුක් ගල් හෝ බොරළු ලබා ගැනීමට ගල්වළවල් කැපීම (මිනිසුන් පස් දෙනකු හෝ ඊට වැඩි දෙනකු විසින්).
(2) කළු ගල් කැපීම හෝ කැඩීම.
(3) කොප්පරා වෙළඳාම සඳහා ගබඩා කිරීම.
(4) කපාපු පොල් සකස් කිරීම.
(5) මිනිරන් වියළා සකස් කිරීම හෝ ගබඩා කිරීම.
(6) යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම.
(7) තෙල් සිඳීම සඳහා සෙක්කුවක් පවත්වාගෙන යෑම.
(8) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම.
(9) කපු, පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම.
(10) ස්වර්ණාභරණ සෑදීම.
(11) හාල් මෝලක් පවත්වාගෙන යෑම.
(12) වී කෙටීම සඳහා වී කොටන යන්ත්‍රයක් පවත්වාගෙන යෑම.
(13) සිසිල් බීම කර්මාන්තශාලාවක් පවත්වාගෙන යෑම.
(14) යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරවන යන්ත්‍රෝපකරණ පාවිච්චි කරනු ලබන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
(15) භූමිතෙල් ගබඩා කිරීම.
(16) ගිනිපෙට්ටි කර්මාන්තය.
(17) ගිනිපෙට්ටි කර්මාන්තය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ගබඩා කිරීම.
(18) ඡායාරූප ශාලාවක් පැවැත්වීම.
(19) ලීබඩු සාප්පුවක් පැවැත්වීම.
(20) කම්කරුවන් පස් දෙනකුට වැඩියෙන් සේවයෙහි යොදවනු ලබන ගෘහ භාණ්ඩ සාදන ස්ථානයක් පැවැත්වීම.
(21) මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

2\. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) ජාඩි හෝ කරවල හොණ්ඩර 3කට වඩා ගබඩා කිරීම.
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(3) පොහොර සෑදීම.
(4) විනාකිරි සෑදීම.
(5) සබන් සෑදීම.
(6) හම් පදම් කරන ස්ථානයක් පැවැත්වීම.
(7) පුවක් වියළා සකස් කිරීම.
(8) සතුන්ගේ ලේ හෝ අතුණුබහන් උණු කිරීම.
(9) සතුන්ගේ හම් ගබඩා කිරීම.
(10) සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම.
(11) මාළු අයිස් දැමීම.
(12) ලෑලි පොඟවා සකස් කිරීම.
(13) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් සකස් කිරීම.
(14) රබර් සෑදීම හෝ පිරිසිදු කිරීම.
(15) කෘත්‍රිම පෝර හෝ මිශ්‍ර පෝර සෑදීමට ගන්නා අමු ද්‍රව්‍ය ගෝනි 3 ට වඩා ගබඩා කිරීම.
(16) සෝඩා සෑදීම.
(17) දුම්කොළ වියළා සකස් කිරීම.
(18) සුරුට්ටු කර්මාන්තය.
(19) රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
(20) සැණි හකුරු සෑදීම.
(21) බීඩි සෑදීම.
(22) කොප්පරා වේලීම.
(23) දරමඩුවක් පවත්වාගෙන යෑම.
(24) අම්ලකර වායුව පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යෑම.
(25) බැටරි චාජ් කිරීම.
(26) පොල් ලෙලි පෙඟවීම සඳහා පොල් ලෙලි කොටුවක් පවත්වාගෙන යෑම.
(27) ලී මඩුවක් පවත්වාගෙන යෑම.
(28) කම්හලක් පවත්වාගෙන යෑම.

3\. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම.
(2) කොහු හෝ කෙඳි සායම් කිරීම.
(3) ගඩොල් හෝ උළු පිළිස්සීම.

2–786—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී—බී. 28/58

## සුළු නගර සභා ආඥපනත

### චන්කානෙයි නගරය

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 වැනි හා 156 වැනි වගන්ති යටතේ චන්කානයි සුළු නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥපනතෙහි 153 වැනි වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ක්වූ ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

#### ආයුර්වේද ඖෂධ ශාලා

1\. (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 128 වැනි වගන්තිය යටතේ සභාව විසින් පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව සභාව විසින් නඩත්තු කළ යුතු අතර, 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ලියා පදිංචි කරන ලද වෛද්‍ය වරයකු භාරයේද තැබිය යුතුය.

2\. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වෛද්‍යවරයකු විසින් හෝ ඒ සඳහා සභාව විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින්, සභාව විසින් නියම කරනු ලබන ආයුර්වේද ඖෂධ ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලවු පිළිබඳ යම් යම් පොත් පත් හා වෙනත් එබඳු වාර්තාද සභාව විසින් අනුමත කරනු ලබන එබඳු පිළිවෙල හා ආකාරය අනුව තැබිය යුතුය.

3\. සභාව විසින් ආයුර්වේද ඖෂධ ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් පොදු අරමුදලෙන් අවුරුදුපතා වෙන්කරවා ගත හැකි අතර එසේ වෙන් කිරීම සඳහා චන්කානෙයි නගරයේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හෝ වරින් වර සභාව විසින් සම්මත කරගනු ලබන පරිපූරණ ඇස්තමේන්තුවලින් විධිවිධාන සැලැස්විය යුතුය.

4\. ආයුර්වේද ඖෂධ ශාලාවේ ප්‍රතිකාර, රෝගීන්ට නොමිලයේ සැපයිය යුතු අතර එකී ප්‍රතිකාර චන්කානෙයි නගරයේ පදිංචිකරුවන්ට සීමා විය යුතුය.

5\. දෙසැම්බර් 31 වැනි දින අවසන්වන එක් එක් අවුරුද්ද අවසානයේදී, ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද ඖෂධ ශාලාවට ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියපැහැදම් වන මුදල් ද පෙන්නුම් කරන සටහනක් සභාපති විසින් සම්පාදනය කරවිය යුතුය.

6\. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ආයුර්වේද ඖෂධ ශාලාව" යනුවෙන් සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද ඖෂධ ශාලාව අදහස් කරනු ලැබේ;

"සභාව" යනුවෙන් චන්කානෙයි සුළු නගර සභාව අදහස් වේ: තවද "සභාපති" යනුවෙන් චන්කානයි සුළු නගර සභාවෙහි සභාපති අදහස් වේ.

2–779—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## පොල්ගහවෙල සුළු නගර සභාව

### 1966 වරිපනම් ලේඛනය

1966 වර්ෂය වෙනුවෙන් පිළියෙල වී ඇති පොල්ගහවෙල සුළු නගර සභාවේ වරිපනම් ලේඛනය රාජකාරි වේලාවන් තුළ මෙම කාර්යාලයේදී පරීක්ෂා කිරීම සඳහා විවෘතව ඇති බව (256 වැනි අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපනතේ අංක 165 දරණ වගන්තිය අනුව කියවෙන (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥාපනතේ අංක 235 (1) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. සිරිසේන,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

සුළු නගර සභා කාර්යාලය,
පොල්ගහවෙල, 1966.2.7.

2-790—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත සුළු නගර සභාව

### 1966 වර්ෂයේ වරිපනම් ලේඛන

1966 වර්ෂය සඳහා වූ බෙලිඅත්ත සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයයේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වන වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) නාගරික සභා ආඥාපනතේ 235 (1) දරන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ටී. එච්. සෝමදාස,
සභාපති,
සුළු නගර සභාව, බෙලිඅත්ත.

1966.2.5 වෙනි දින,
බෙලිඅත්ත සුළු නගර සභා කාර්යාලය.

2-785—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### ජලභීතිකා රෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ "ජලභීතිකා ආඥාපනතේ" 11 වෙනි වගන්තියේ ප්‍රකාර (333 වෙනි පරිච්ඡේදය) "අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා" සීමාව ඇතුලත පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක නැතහොත් ගෙවත්තක නොවූ අන් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමු වන දඬාවතේ යන නැතහොත් දක්කාගෙන නොයනු ලබන කිසියම් සුනඛයෙකු (බල්ලෙකු) මා විසින් ලියවිල්ලකින් දෙන ලද බලය ලත් අයෙකු විසින් එවලේම විනාශ කරනු ලබන බව මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1966 මාර්තු මස 1 වෙනි දින සිට හය මාසයක් වලංගු වන්නේ ය.

ඩබ්ලිව්. ඇස්. සොයිසා,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
අවිස්සාවේල්ල, 1966.2.8.

2-788—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ මඩහපොල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත්, මෙම බලපත්‍ර නිකුත්කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මඩහපොල ගම්ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඩවන්නේ අසවල් කරුණු නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට්පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡෙදයේ අංක 7 දරණ 1947 අංක 44 ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

ජී. බී. දසනායක,
මඩහපොල ගම්සභාවේ සභාපතිතැන.

ගම්සභා කායයාිලය,
මඩහපොල, 1966.2.6.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| කේ. ඇල්. අබ්දුල් හමීදු, මායිවෙල, මැල්සිරිපුර | මායිවෙල, බණ්ඩාර- පොලගෙදර වත්ත | එළහරක් මස් |

2-774—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපණත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ පහලගම්භය ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1963 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 20, 21, 22, 23, 27, 29, 33, 36, 37, සහ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරනු ලැබූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට පහලගම්භය ගම්සභාව විසින් පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (261 වන පරිච්ඡේදයේ) 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ප්‍රේමරාජ කුමාරසිංහ,
පහලගම්භය ගම්සභාවේ සභාපති.

1966.2.5,
පහලගම්භය ගම්සභා කාර්යාලය,
හබුරුගල.

2-759—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

## මාලිම්බඩ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් අය එහි සඳහන් කර තිබෙන ස්ථානයේ 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්වා ඉල්ලුම් පත්‍රයක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන, මාලිම්බඩ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුඩවන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුඩවන්නේ කුමන හේතූන් නියා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| වර්ෂය | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳම |
|---|---|---|
| 1966 | ... යූ. ඇල්. එම්. ෂරප්දීන්, හොරගොඩ, තෙලිජ්ජවිල ... | හොරගොඩ දෙනිමුල්ල හේන. එළ හරක් මස් සහ එළු මස්. |

හෙන්රි ඇලස්,
සභාපති තැන.

වර්ෂ 1966ක් වූ පෙබරවාරි මස 8 වැනි දින,
මාලිම්බඩ ගම්සභා කාර්‍යාලයේදිය, තෙලිජ්ජවිල.

2-762—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## මුන්නේස්සරම් පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූ ද මුන්නේස්සරම් පත්තු ගම්සභාවේ සභාපති තැනවූද වී. මංචනායක වන මම, 1966 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී හලාවත දිස්ත්‍රික්කයේ මුන්නේස්සරම් පත්තු ගම්සභා සීමාව ඇතුලත මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම සම්පූර්ණයෙන් මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

ජනවාරි 6
පෙබරවාරි 4
මාර්තු 6
අප්‍රේල් 4
මැයි 4
ජූනි 2
ජූලි 1
ජූලි 31
අගෝස්තු 30
සැප්තැම්බර් 28
ඔක්තෝබර් 28
නොවැම්බර් 27
දෙසැම්බර් 26

වී. මංචනායක,
සභාපති.

1966.2.9,
මුන්නේස්සරම් පත්තු ගම්සභා කාර්‍යාලය,
කාක්කාපල් ලිය.

2-766—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## මුන්නේස්සරම් පත්තු ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

පහත දැක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් තැනැත්තා විසින් එහි ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම් පතක් ඉදිරිපත්කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7(2) වගන්තියේ ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන හලාවත දිස්ත්‍රික්කයේ මුන්නේස්සරම් පත්තු ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් ඔහු හෝ ඇ විරුද්ධ වන්නේ කුමන කරුණක් සඳහාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම නිවේදනය පලවී දින 14 ක් ඇතුලත දී මාවෙත ඉදිරිපත්කළ යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| එච්. පී. ගුණවර්ධන, බණ්ඩරවත්ත, කාක්කාපල්ලිය ... | හරක්මස් ... | පට්ටියවෙලගාල වත්ත, බණ්ඩරවත්ත. |

වී. මංචනායක,
මුන්නේස්සරම් පත්තු ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්‍යාලය,
කාක්කාපල්ලිය, 1966.2.9.

2-767—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරලේ දාමහන ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 නේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 නේ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ කාණ්ඩ, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරලේ දාමහන ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ඒ. අප්පුහාමි,
සභාපති.

1965 ඔක්තෝම්බර් මස 5 වැනි දින,
බලන්ගොඩ-දිගදුරේ,
දාමහන ගම්සභා කාර්‍යාලයේදිය.

2-768/1—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරළේ දාමහන ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 හේ ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල 38 කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරළේ දාමහන ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ඒ. අප්පුහාමි,
සභාපති.

1965 ඔක්තෝම්බර් මස 5 වැනි දින,
බලන්ගොඩ-දිගදුරේ,
දාමහන ගම්සභා කාය්‍යාලයේ දීය.

2–768/2—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත
### (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලය පරිදි නියමිත අධිකාරි තැනවූද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දුව ගම්සභාවේ සභාපති තැනවූද, ජේ. එච්. ටිකිරිබණ්ඩා වන මම, 1966 වර්‍ෂයේ දී මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනයන්හි උඩුබද්දාව ගම්සභා ප්‍රදේශයේ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම සම්පූර්ණයෙන් තහනම් කරමි.

ජේ. එච්. ටිකිරිබණ්ඩා,
උඩුබද්දාව ගම්සභාවේ සභාපති.

1966 ජනවාරි මස 27 වන දින,
උඩුබද්දාව ගම්සභා කාය්‍යාලයේ දී.

### උපලේඛනය

1966 ජනවාරි 6—දුරුතු පසළොස්වක් පොහොය
1966 පෙබරවාරි 4—නවම් පසළොස්වක් පොහොය
1966 මාර්තු 6—මැදින් පසළොස්වක් පොහොය
1966 අප්‍රියෙල් 4—බක් පසළොස්වක් පොහොය
1966 මැයි 4—වෙසක් පසළොස්වක් පොහොය
1966 මැයි 5—වෙසක් අතිරේක දිනය
1966 ජූනි 2—පොසොන් පසළොස්වක් පොහොය
1966 ජූලි 2—ඇසළ පසළොස්වක් පොහොය
1966 ජූලි 31—ඇසළ පසළොස්වක් පොහොය
1966 අගෝස්තු 30—නිකිනි පසළොස්වක් පොහොය
1966 සැප්තැම්බර් 28—බිනර පසළොස්වක් පොහොය
1966 ඔක්තෝබර් 4—සමස්ත ලෝක සත්ව දිනය
1966 ඔක්තෝබර් 28—වප් පසළොස්වක් පොහොය
1966 නොවැම්බර් 26—ඉල් පසළොස්වක් පොහොය
1966 දෙසැම්බර් 26—උඳුවප් පසළොස්වක් පොහොය

2–782—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## 1962කේ අංක 6 දරන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරලේ තලාපිටගම්පත්තුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 නේ ජූනි මස 21 වැනි දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965හේ ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට කඩවත කෝරලේ තලාපිටගම් පත්තුව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

ඇම්. ඒ. ජයසිංහ,
සභාපති තැන.
කඩවතකෝරලේ තලාපිටගම්පත්තුව ගම්සභාව.

වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 8 වැනි දින,
කඩවත කෝරළේ තලාපිටගම්පත්තුව ගම්සභා කාර්යාලයේ දීය.
බෙලිහුල්ඔය.

2–771—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

---

## පට්ටිපොල කෝරළයේ ගම්සභාව

### පට්ටිපොල ගම්සභාවට අයත් මංමාවත් සහ අඩිපාරවල්

බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොල කෝරළයේ ගම්සභාව විසින් 65.5.28 දින අංක 7 (2) දරණ යෝජනාව සම්මත කරගන්නා ලද බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

1966 ජනවාරි මස 31 දින,
ගම්සභා කාය්‍යාලය,
ලුණුගල.

පට්ටිපොල කෝරළයේ ගම්සභාවේ සභාපති.

### යෝජනාව

ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 261 වැනි පරිච්ඡෙදයේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොල කෝරළයේ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් වර්ෂ 1954 මැයි මස 14 දින අංක 10,672 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මතවූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි වගන්තියේ සිට 8 (4) දක්වා ඇති ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් සහ අඩිපාරවල් එකී නෙක ඉදිරියෙන් දැක්වෙන දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යායුතු යැයි යෝජනා කරනු ලැබේ.

| අංකය | පාරේ නම | දිග සැ. දු. | පළල අඩි | පටන්ගන්නා ස්ථානය | අවසාන ස්ථානය |
|---|---|---|---|---|---|
| 1. | කිරවනාගොඩ පාර | 4 00 | 8 | අරවාකුඹුර ප්‍ර : මා | කිරවනාගොඩ |
| 2. | උඩකිරුව–පීස්ස පාර | 8 00 | 14 | උඩකිරුව | පීස්ස |
| 3. | දෙල්ගොල්ල පාර | 2 00 | 6 | අරවාකුඹුර | දෙල්ගොල්ල |
| 4. | යපම්ම පීස්ස පාර | 4 00 | 14 | යපම්ම | පීස්ස |
| 5. | ලුනුගල උඩකිරුව පාර | 5 00 | 14 | ලුනුගල | උඩකිරුව |
| 6. | ලුනුගල ගල්ලිඳකපල්ල පාර | 7 00 | 20 | ලුනුගල | ගල්ලිඳ කපල්ල |
| 7. | වැදිවෙල පත්තිනිකුඹුර පාර | 2 00 | 8 | වැදිවෙල | පත්තිනිකුඹුර |
| 8. | පල්ලේපංගුව–උඩකිරුව පාර | 4 00 | 10 | පල්ලේපංගුව | උඩකිරුව |
| 9. | සුප්පමලේ යටිවර පාර | 2 40 | 8 | සුප්පමලේ | යටිවර |
| 10. | පුල්ලැහකඳුර–පාක්වත්ත පාර | 5 00 | 8 | පුල්ලැහකඳුර | පාක්වත්ත |
| 11. | හොප්ටන්–යටිවර පාර | 3 40 | 8 | හොප්ටන් | යටිවර |
| 12. | ලුනුගල ගම පාර | 3 00 | 14 | ලුනුගලපොළිසිය | වැදිවෙල |
| 13. | ලුනුගල කිරවානාගොඩ පාර | 3 00 | 12 | ලුනුගලගම | කිරවනාගොඩ |
| 14. | වැදවෙල මඩුල්සිම පාර | 5 00 | 14 | වැදිවෙල | මුඩුල්සීම |
| 15. | අරවාකුඹුර 29 කණුව පාර | 60 | 8 | අරවකුඹුර 29 කණුව | කිරුවනාගොඩ පාර |
| 16. | පල්ලේපංගුව–පාක්වත්ත පාර | 40 | 8 | පල්ලේපංගුව | පාක්වත්ත |
| 17. | කරදේගම පාර | 2 40 | 14 | පල්ලේකිරුව | කරදේගම |
| 18. | උඩකිරුව පාර | 4 00 | 12 | හොරගොල්ල | උඩකිරුව |
| 19. | අලකොලගල පාර | 1 40 | 12 | අරවාකුඹුර | අලකොලගල |
| 20. | වේරගොඩ පාර | 1 30 | 6 | පීස්ස පාර | කිරිඹය හරහා |
| 21. | ලුනුගල ගම පාර | 2 00 | 6 | උඩපංගුව | ලුනුගල ගම |
| 22. | වෙල්ලවෙල පාර | 1 40 | 10 | කීණගොඩ | වෙල්ලවෙල ගම |
| 23. | උඩගම පාර | 3 00 | 3 | අඩාවත්ත | උඩගම |
| 24. | කොට්ටල්බැද්ද පාර | 1 30 | 8 | ප්‍රධාන මාවත | කොට්ටල්බැද්ද |
| 25. | කොට්ටල්බැද්ද සුසානභූමි පාර | 40 | 6 | කොට්ටල්බැද්ද පාර | සොහොන් භූමිය |
| 26. | වේවැල්කැටිය පාර | 4 00 | 12 | ලුනුගල නගරය | පල්ලේකිරුව |
| 27. | නුගහමුර පාර | 2 00 | 8 | උඩකිරුව | නුගහමුර |
| 28. | කිවුලේගම පාර | 10 | 6 | කුඹුකන්ඔය | ගල්ලිඳකපල්ල පාර |
| 29. | කොකෝවත්ත පාර | 2 00 | 8 | කෝකෝවත්ත | පල්ලේකිරුව |
| 30. | දෙහිතැන්න පාර | 10 | 4 | මැදගම්ගොඩ ගම | දෙහිගහතැන්න |
| 31. | යටියාගර ගම පාර | 10 | 4 | මැදගම්ගොඩ ගම | යටියාගර ගම |
| 32. | මයිලගස්තැන්න පාර | 20 | 4 | මැදගම්ගොඩ ගම | මයිලගස්තැන්න |
| 33. | මා පැල්ල පාර | 10 | 3 | මා පැල්ල පහල | මාපැල්ල ඉහල |
| 34. | ඇකුනදූමුවාව පාර | 1 40 | 6 | ඇකුන්දූමුවාව | අරවාකුඹුර |
| 35. | එලමල්පොත එගොඩවත්ත පාර | 1 00 | 6 | ලුනගලගල්ලිඳකපල්ල පාර සිට | එලමල්පොත පහලවෙල්යාය ඇල |
| 36. | වැදිවෙල දඹගස්ගොඩ පාර | 3 00 | 12 | ලුනගල ගල්ලිඳකපල්ල පාර | ලුනුගල ගල්ලිඳ කපල්ල පාර |

2–773—66.2.17 දින අංක 14,673 දරන ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

**2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.**

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ **ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක්** හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

**6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් කර එවනවා නම් වඩාත් හොඳයි.**

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. 1966 මාර්තු මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | |
|---|---|---|
| | රු. | ශ. |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 15 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 15 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකඩ ... ... | 165 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 330 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

**11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

**13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | | පිටරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| **එක් කොටසක් ... ... ...** | **27** | **50** | **...** | **40** | **50** |
| **I වැනි කොටසේ එක ඡේදයක් ... ...** | **17** | **50** | **...** | **23** | **0** |
| **I වැනි කොටසේ ඡේද දෙකක් ... ...** | **25** | **0** | **...** | **33** | **0** |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ | | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 | 30 | ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 | 60 | ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 15 | ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | ... | 0 | 15 |

**දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන **ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය** සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු | 66. 3. 4 | සිකුරාද | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සිකුරාද | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් | 66. 4. 1 | සිකුරාද | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්ද | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි | 66. 5. 6 | සිකුරාද | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි | 66. 6. 3 | සිකුරාද | 66. 5.25 | බදාද | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්ද | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි | 66. 7. 1 | සිකුරාද | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | 66. 8. 5 | සිකුරාද | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | 66. 9. 2 | සිකුරාද | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 66.10. 7 | සිකුරාද | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | 66.11. 3 | බ්‍රහස්පතින්ද | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | 66.12. 2 | සිකුරාද | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි